නිවාස, ඉදිකිරීම්, සහ ජලසම්පාදන අමාත්‍යාංශය

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
நிர்மாணக் கைத்தொழில் அபிவிருத்தி அதிகாரசபை
CONSTRUCTION INDUSTRY DEVELOPMENT AUTHORITY

CETRAC
CONSTRUCTION EQUIPMENT TRAINING CENTRE

# ලංසු සඳහා ආරාධනයයි

## 2026-2027 වසර සඳහා ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානයේ ආපනශාලාව පවත්වාගෙන යාම.

ලංසුපත් අංකය : 1/4/7/00/93-2026

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අයත් නො 17, ඩී. පී. විජේසිංහ මාවත, පැලවත්ත, බත්තරමුල්ල ස්ථානයෙහි ස්ථාපිත ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථාන **(CETRAC)** පරිශ්‍රයෙහි 2026/2027 වසර සඳහා ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි මිල ගණන් කැඳවනු ලැබේ.
(මේ පිළිබඳ සියලු විස්තර **www.cida.gov.lk** වෙබ් අඩවියේ පළකර ඇති අතර පහත **QR** කේතය හරහා පහසුවෙන් පිවිසිය හැක.)

**උපලේඛනය**

| ලංසුපත් අංකය | කොන්ත්‍රාත්තු විස්තරය | නැවත නොගෙවන ලංසු ෆෝරම ගාස්තුව රු. |
|---|---|---|
| 1/4/7/00/93-2026 | ආපනශාලාව පවත්වාගෙන යාම **CETRAC** පුහුණු මධ්‍යස්ථානය | 1500.00+18%VAT |

මේ සඳහා ලංසුකරුවන් අදාළ ක්ෂේත්‍රයේ රජයේ ව්‍යාපාර ලියාපදිංචිය ලබාගෙන තිබිය යුතුය.

**ලංසු පරීක්ෂා කිරීම**

මේ සඳහා උනන්දුවක් දක්වන ලංසුකරුවන් හට **2026.07.20** දින සිට **2026.08.06** දින දක්වා කාර්යාල දිනවල **පෙ.ව. 9.30** සිට **ප.ව. 3.30** දක්වා **CETRAC** ආයතනය වෙත පැමිණ මුළුතැන්ගෙය හා ආයතන පරිශ්‍රය පරීක්ෂා කළ හැක.

**ලංසු ෆෝරමයන් නිකුත් කිරීම**

**2026.07.20** වෙනි දින සිට **2026.08.06** දක්වා සතියේ සාමාන්‍ය කාර්යාල දින වල **පෙ.ව. 09.30** සිට **ප.ව. 3.30** දක්වා ආපසු නොගෙවනු ලබන **රු. 1500.00 + වැට් බදු** ටෙන්ඩර් තැන්පත් මුදලක් ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමි වෙත ගෙවා රිසිට්පත් සැපයීම් නිලධාරී වෙත ඉදිරිපත් කිරීමෙන් නියමිත ටෙන්ඩර්පත් සහ කොන්දේසි මාලාවේ පිටපත ලබාගත හැකිය.

**ලංසු විවෘත කිරීම**

මුද්‍රා තබන ලද ලංසු මුල් පිටපත හා අනුපිටපත වෙන වෙනම කවරවල බහා එම කවර දෙකම එක් තනි කවරයක බහා මුද්‍රා තබා පිටකවරයේ වම් කෙළවරේ **"CETRAC පුහුණු මධ්‍යස්ථාන පරිශ්‍රයෙහි ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා මිල ගණන් කැඳවීම 2026-2027 සඳහා ලංසු කැඳවීම"** යනුවෙන් පැහැදිලිව සටහන් කර **2026.08.07** දින **ප.ව. 2.30** ට පෙර ලැබෙන සේ
**සභාපති, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, සව්සිරිපාය, 123, විජේරාම මාවත, කොළඹ 07**
යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ එකී ලිපිනයේ ආයතනය තුළ ඇති ටෙන්ඩර් පෙට්ටිය වෙත අතින් ගෙනවිත් බහාලීම හෝ සිදු කළ යුතුය.

එම ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම ඉහත ලිපිනයේ සැපයුම් අංශ කාර්යාලයේදී **2026.08.07** දින **ප.ව. 2.30** ට පැමිණ සිටින ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේ ලංසු විවෘත කරනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා **011-2 699 801** සැපයීම් නිලධාරී අමතන්න.

දුරකථන අංක:
0112784413/0112786829 (**CETRAC** ආයතනය)

**සභාපති - ප්‍රසම්පාදන මණ්ඩලය**
**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය**
සව්සිරිපාය
123, විජේරාම මාවත, කොළඹ 07.

**Tel**: 011 2 699 801 (ext 437) / 011 2 784 413 **Fax**: 2 686 089
**Email**: ictadsupply@gmail.com **Web** : www.cida.gov.lk